**ශීර්ෂ 271 - ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ ශීර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

**1. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ප්‍රාදේශිය ලේකම් කාර්යාල**

(අ) නගර හා කඩවත්

(ආ) පදවි ශ්‍රී පුර

(ඇ) ගෝමරන්කඩවල

(ඈ) කින්නියා

(ඉ) සේරුවිල

(ඊ) මුතුර්

(උ) කන්තලේ

(ඌ) කුච්චවේලි

(එ) මොරවැව

(ඒ) තඹලගමුව

(ඔ) වෙරුගල්

**1.1 විගණන විෂය පථය**

ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමණාකරණ විගණන වාර්තාව 2015 ජූලි 22 දින ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගණන් දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. 329,692,000 ක් වු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. 323,065,594 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. 6,626,406 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 2 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2014 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.** | **රු.** | **රු.** | |
| පුනරාවර්තන | 291,292,000 | 286,328,705 | 4,963,295 | 1.7 |
| මුලධන | 38,400,000 | 36,736,889 | 1,663,111 | 4.3 |
| **එකතුව** | **329,692,000** | **323,065,594** | **6,626,406** | **2.0** |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 13 ක් හා දෙපාර්තමේන්තු 08 ක් විසින් පිළිවෙලින් රු.966,877,829 ක් හා රු.12,591,810 ක් වශයෙන් එකතුව රු. 979,469,639 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම ප්‍රතිපාදනවලින් රු.860,215,883 හා රු.11,267,973 ක් වශයෙන් එකතුව රු.871,483,856 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. ඒ අනුව පිළිවෙලින් රු.106,661,946 ක් හා රු.1,323,837 ක් වශයෙන් රු.107,985,783 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 2.2. අත්තිකාරම් ගිණුම්

### 2.2.1 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂයය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 27101 | 33,000,000 | 21,252,013 | 20,000,000 | 14,259,069 | 130,000,000 | 72,931,270 |

## 2.3 අග්‍රිම ගිණුම

ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට අංක 7002/0000/00/0289/0014/000 දරන අග්‍රිම ගිණුමේ ශේෂය රු.78,705,293 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම

ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට අංක 6003/0000/00/0047/0000/000 දරන තැන්පත් ගිණුමේ ශේෂය රු. 224,475,056 ක් විය.

**2.5 විගණන නිරීක්ෂණය**

**----------------------**

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශනය සම්බන්ධයෙන් වූ විගණන නිරික්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරික්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ දක්වා ඇත.

**3. ශීර්ෂ 271 ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**----------------------------------------------------------**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

**--------------------------------------------**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක් විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) |
| විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) |
| හානි පිළිබද ලේඛනය | මුදල් රෙගුලාසි 110 |
| බැරකම් පිළිබඳ ලේඛනය. | මුදල් රෙගුලාසි 214 |
| ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තා | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3(අ) මාර්ගෝපදේශය |
| ලංසු කැඳවීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය |

## 3.2 සීමා නොපිළිපැදීම

2013 අංක 36 දරන විසර්ජන පනතේ තෙවන උපලේඛනයේ සඳහන් පරිදි ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විෂය අංක 27101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම සඳහා අවම ලැබීම් සීමාව රු. 20,000,000 ක් ලෙස සඳහන් කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට තථ්‍ය ලැබීම් රු.14,259,069 ක් වී තිබුණි. ඒ අනුව රු.5,740,931 කින් අවම ලැබීම් සීමාව කරා ළඟා වී නොතිබුණි.

## 3.3 විසර්ජන ගිණුම

### 3.3.1 අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

වැය විෂයයන් 04 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 ක සිට සියයට 47 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

### 3.3.2 වෙනත් අමාත්‍යාංශ විසින් ලබා දුන් ප්‍රතිපාදන

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** දිස්ත්‍රික්කයේ අලි මිනිස් ගැටුම වැලැක්වීමට පිළියමක් ලෙස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 09 ක අලි වැට 26 ක් ඉදිකිරීම සඳහා 2014 පෙබරවාරි 28 දින ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් රු.මිලියන 75 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. එම ප්‍රතිපාදනවලින් රු.මිලියන 15.6 ක් හෙවත් ලබා දී තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 21 ක් පමණක් වැය කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට ගෝමරන්කඩලව, කන්තලේ, වෙරුගල් හා මූතූර් යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි ඉදිකිරීමට සැලැසුම් කර තිබුණු අලිවැට 11 ක් ඉදිකර නොතිබුණි.

(ආ) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 ක පෙර පාසල් ළමුන් සඳහා කිරි වීදුරුවක් ලබා දීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට 2014 වර්ෂයේදී ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය විසින් රු.9,007,710 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ලබා දී තිබුණු ප්‍රතිපාදනයෙන් රු.4,638,601 ක් හෙවත් සියයට 51 ක ප්‍රමාණයක් උපයෝජනය කර නොතිබුණි.

(ඇ) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ තුන්වන කන්නයේ මුං ඇට වගාව ප්‍රචලිත කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් රු. මිලියන 16.618 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එම ප්‍රතිපාදනයෙන් රු.මිලියන 3.691 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව මුළු ප්‍රතිපාදනයෙන් සියයට 78 ක ප්‍රමාණයක් අදාළ කාර්ය සඳහා උපයෝජනය කර නොතිබුණි.

**(ඈ)** ගොවීන් අතර කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය ප්‍රචලිත කිරීම සඳහා 2014 වර්ෂයේදී කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් රු.මිලියන 5.4 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉන් රු.මිලියන 4 ක් හෙවත් සියයට 74 ක ප්‍රමාණයක් ආදාළ කාර්ය වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි.

**3.4 අග්‍රිම ගිණුම**

**--------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2015 අප්‍රේල් 30 දින වන විට පියවා නොතිබුණු අග්‍රිම ශේෂය රු.78,705,293 ක් වී තිබුණි. එම ශේෂය තුළ 2011 වර්ෂයේ සිට පැවැත එමින් තිබුණු එකතුව රු.130,000 ක් වූ ශේෂයක්ද විය.

(ආ) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කාර්යය නිමකළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත්, අවස්ථා 20 කට අදාලව ලබා දී තිබුණු එකතුව රු.179,125 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්යය නිමවී මාස 01 ක සිට මාස 04 ක් දක්වා කාල පරාසයක ප්‍රමාදයකින් පසුව නිරවුල් කර තිබුණි.

(ඇ) 2014 නොවැම්බර් 20 දිනැති අංක 04/2014 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛය ප්‍රකාරව 2014 දෙසැම්බර් 31 දින මුදල් පොත පියවීම සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එසේ කටයුතු කර නොතිබණුණි. විස්තර පහත දැක්වේ.

(i) ඉහත සඳහන් චක්‍රලේඛයේ 2.1 ඡේදය ප්‍රකාරව 2014 දෙසැම්බර් 31 දිනට මුදල් පොතේ ශේෂය පිළිබඳ සටහනක් බැංකුවට භාර දී බැංකුව මඟින් හර නිවේදනයක් ලබා ගෙන එය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් අග්‍රිම ශේෂය පියවා තිබුණේ 2015 ජනවාරි 27 දිනය. ඒ සඳහා 2015 ජනවාරි 26 හා 27 දිනයන්හි පිලිවෙලින් රු. 38,575,293 ක් රු. 40,000,000 ක් වූ එකතුව රු. 78,575,293 ක හර නිවේදන ලබා ගෙන තිබුණි.

(ii) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ 2014 දෙසැම්බර් මාසයේදී ඇති වූ හදිසි ගංවතුර ආපදා තත්ත්වය නිසා පීඩාවට පත් ජනතාවට කඩිනමින් පිසූ ආහාර, වියළි ආහාර හා අනෙකුත් අවශ්‍ය සහන සැපයීම සඳහා අංක GAT/DDMC/NDRSC/Flood A/2014 දරන 2014 දෙසැම්බර් 28 සහ 2014 දෙසැම්බර් 29 දිනැති ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම්ගේ ලිපි මගින් රු. මිලියන 50 ක ප්‍රතිපාදන භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් ඉල්ලුම් කර තිබුණි. ඒ අනුව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් රු.මිලියන 40 ක අග්‍රිම ලබා දී තිබුණි. අදාල සහන සැපයීම සඳහා එම මුදල් භාවිතා කිරීමකින් තොරව 2015 ජනවාරි 27 දින ආපසු පියවා තිබුණි.

## 3.5 පොදු තැන්පත් ගිණුම

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

**(අ)** වර්ෂ 2 ක් ඉක්ම වූ එකතුව රු 35,052,909 ක් වූ තැන්පතු 379 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් විවිධ කාර්යයන් සඳහා 2011 අගෝස්තු හා 2013 පෙබරවාරි මාසවලදී ලබාදී තිබුණු රු.500,000 ක ප්‍රතිපාදන අදාල කාර්යය භාරයන් ඉටු නොකර තැන්පත් ගිණුමේ 2014 දෙසැම්බර් 31 දින වන විටත් රඳවා ගෙන තිබුණි.

## 3.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 27101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂාවේ දි පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

**(අ)** විශ්‍රාම හා මිය ගිය නිලධාරීන්ගේ අත්තිකාරම් ශේෂයන් ආපසු අය කිරීම සම්බන්ධව ආයතන සංග්‍රහයේ XXIV පරිච්ජේදයේ 4 වන වගන්තිය ප්‍රකාරව කටයුතු නොකිරීම 2005 හා 2013 වර්ෂවලදී විශ්‍රාම ගිය නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයවිය යුතු රු.306,806 ක ණය ශේෂයන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අය කර ගෙන නොතිබුණි.

(ආ) 2004 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා කාල පරාසය තුළ වැඩ තහනමට ලක් වූ නිලධාරීන් 07 දෙනෙකුගෙන් අය විය යුතු රු.858,363 ක ණය ශේෂයන් 2014 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනිමට අපොහොසත් වි තිබුණි.

(ඇ) 2006 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා වූ කාලපරාසය තුළ සේවය හැර ගිය නිලධාරීන් 11 ක ගෙන් අයවිය යුතු රු.1,125,042 ක ණය ශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 හා 4.6 වගන්ති අනුව කටයුතු කර නොතිබුණි.

(ඈ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු 5,898,844 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 06 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

**3.7 වත්කම් කළමනාකරණය**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

**(අ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

ත්‍රිකුණාමලයේ පේදුරු කොටුවේ අක්කර 372 ක භූමිය, එහි පිහිටි ගොඩනැගිලි හා නිවාස 1981 ජනවාරි 16 දිනැති අංක 124 දරන ගැසට් නිවේදනය අනුව පුරා විද්‍යා භූමියක් ලෙස ප්‍රකාශයට පත්කර තිබුණි. ඒ අනුව 2011 ඔක්තෝබර් මාසය දක්වා ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පවත්වාගෙන ගිය ගොඩනැගිලි පුරා විද්‍යා දෙපාර්තමේන්තුවට නීත්‍යානුකූලව පවරා දෙන ලෙස, 2011 ජනවාරි 04 දිනැති අංක M/EP/1/7A දරන පුරා විද්‍යා අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මඟින් දැනුම් දී තිබුණි. කෙසේ නමුත් එම ගොඩනැගිලි 2015 ජුනි 30 දින වන විටත් නීත්‍යානුකූලව පවරා දී නොතිබුණි. දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය මෙන්ම ඇතැම් නිල නිවාසද වර්තමානය දක්වා එම පරිශ්‍රය තුළ ක්‍රියාත්මක වෙමින් පැවතුණි.

**3.8 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 260 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගෙවීම් ලබන අයගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීමකින් තොරව චෙක්පත් නිකුත් කර තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 384 (IV) | නගර හා කඩවත් සහ කන්තලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි චෙක්පත් පිළිබඳව කටයුතු කිරීම බලය පවරනු ලබන නිලධාරීන් විසින් පමණක් එම කාර්යයන් සිදුකර නොතිබුණි. |
| **(iii)** මුදල් රෙගුලාසි 390 (ආ) | නගර හා කඩවත් සහ කන්තලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් හි විෂයභාර නිලධාරින් ආදායකයන් වෙත ගෙවීම සඳහා භාරගන්නා චෙක්පත් සුරක්ෂිත භාරයේ තැන්පත් නොකොට එම ලිපිගොනු අල්මාරියේ අනාරක්ෂිතව තබා තිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 1646 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සංචිත වාහන 08 කට අදාලව 2014 වර්ෂයේ දෛනික ධාවන සටහන් හා මාසික සංසිද්ධි වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| **(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය** | |
| 4.4 මාර්ගෝපදේශය | නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.මිලියන 24.7 ක වටිනාකමින් යුත් අලිවැට 06 ක් ඉදිකිරීමට අදාල ප්‍රසම්පාදනය රු.මිලියන 2 ට අඩුවන සේ කොටස් 18 කට වෙන් කර ග්‍රාමීය ප්‍රජාපාදක සංවිධාන වෙත කොන්ත්‍රාත්තු ප්‍රදානය කර තිබුණි. |

## 3.9 දේශීය මුල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

**(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම**

ගෝමරන්කඩවල, කන්තලේ , වෙරුගල් සහ මුතූර් යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි අලිවැට ඉදිකිරීමේ ව්‍යාපෘති 04 සඳහා පිළිවෙලින් රු.6,000,000 ක්, රු.10,400,000 ක්, රු.3,000,000 ක් හා රු.12,500,000 ක් වශයෙන් ප්‍රතිපාදන සළසා තිබුණි. 2014 ඔක්තෝබර් මාසයේ ආරම්භ කළ යුතුව පැවති එම ව්‍යාපෘති හා සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඒවා අත්හැර තිබුණි. එම ව්‍යාපෘති අත්හැර දැමීමට හේතු වශයෙන් නිශ්චිත කරුණු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි..

**(ආ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර තිබුණත්, එම ව්‍යාපෘති නිම නොකර අතහැර දමා තිබුණි. මෙම ව්‍යාපෘති නිම නොකිරීමට බලපෑ කරුණු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | 2014 දෙසැම්බර් 31 දින වන විට වියදම |
|---|---|---|
| | රු. | රු. |
| සුමේධංකරපුර රේවත මාවතෙහි කාණු පද්ධතිය හා පාර ක්‍රොන්ක්‍රීට් කිරීම | 3,000,000 | - |
| පැතිස්පුර මාවතෙහි කාණු පද්ධතිය හා පාර ක්‍රොන්ක්‍රීට් කිරීම | 7,000,000 | 3,340,276 |
| නෙල්සන් පුර ඇතුළු පාරෙහිකාණු පද්ධතිය හා පාර ක්‍රොන්ක්‍රීට් කිරීම | 10,000,000 | 739,860 |
| වරෝදයනගර් මැද මාවතෙහි කාණු පද්ධතිය හා පාර ක්‍රොන්ක්‍රීට් කිරීම | 5,000,000 | 717,611 |
| සමන්පුර කාණු පද්ධතිය හා පාර ක්‍රොන්ක්‍රීට් කිරීම | 20,000,000 | 4,779,578 |
| කර්නියාඩි මාවතේ කාණු පද්ධතිය හා පාර ක්‍රොන්ක්‍රීට් කිරීම | 7,000,000 | 2,053,714 |
| සල්ලි ,සුනාමි නිවාස ව්‍යාපෘති , කාණු පද්ධතිය හා පාර ක්‍රොන්ක්‍රීට් කිරීම | 3,000,000 | - |
| කප්පල්තුරේ 5 වන, 7 වන මාවත කාණු පද්ධතිය හා පාර ක්‍රොන්ක්‍රීට් කිරීම | 2,500,000 | 1,834,604 |
| පුල්මුඩේ සුනාමි ග්‍රාමීය මාවත කොන්ක්‍රීට් කිරීම | 11,000,000 | 3,964,176 |

| | | |
|---|---|---|
| කුඹුරුපිටිය M.O.H.කාර්යාලය වැඩි දියුණු කිරීම | 4,000,000 | 330,125 |
| යාය 2 පන්සල් මාවත | 6,000,000 | 2,928,537 |
| ජුම්මා පල්ලිය පාර , නාමල් වත්ත | 7,500,000 | 4,978,628 |
| සමගි මාවත | 3,000,000 | - |
| බටුකච්චිය මංසන්ධියේ සිට මුස්ලිම් ප්‍රදේශය දක්වා | 13,900,000 | 879,137 |
| ජබ්බාර් මාවත කාපට් කිරීම | 5,000,000 | 473,593 |
| බුහාරි නගර් ක්‍රීඩා පිටි මාවත වැඩි දියුණු කිරීම | 5,000,000 | 4,274,271 |
| මැද මාවත කාපට් කිරීම | 5,000,000 | 3,083,321 |
| කාවන්තිස්ස පුර මාවත කොන්ක්‍රීට් කිරීම | 16,000,000 | 6,183,693 |

**3.10 කාර්යසාධනය**
**-----------------**

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරි සැලැස්ම අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**
**-----------------------------------------------------**

උතුරු හා නැගනහිර පළාත්වල පශ්චාත් යුධ ගැටුම් සමයේ රජයේ ඉඩම්වලට අදාල ගැටළු විසඳීමේ කඩිනම් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා 2013 ජනවාරි 31 දිනැති අංක 2013/1 දරන ඉඩම් කොමසාරිස් ජනරාල් චක්‍රලේඛය මඟින් උපදෙස් දී තිබුණි. ඉඩම් ගැටළු සම්බන්ධව ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංක 2008/4 චක්‍රලේඛය යටතේ අයදුම්පත් කැඳවීමේදී කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරි කොට්ඨාශ 24 කින් අයදුම්පත් 13724 ක් ඉදිරිපත් කර තිබුණි. ඉන් අයදුම්පත් 4151 ක පමණක් මූලික පරීක්ෂණ සිදු කර තිබූ අතර, ඉන් 9573 ක් සඳහා මූලික පරීක්ෂණ සිදු කර නොතිබුණි.

**3.11 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**
**-----------------------------------**

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ වනජීවි සංරක්ෂණය සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් 2014 පෙබරවාරි 28 දින රු.මිලියන 75 ක ප්‍රතිපාදන සළසා තිබුණි. අලිවැට සඳහා උපකරණ මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවා තිබුණු අතර ඒ සඳහා පුද්ගලික සමාගම් දෙකක් විසින් පිළිවෙලින් රු.274,440 ක් හා රු.337,281 ක් වූ මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2014 ඔක්තෝබර් 21 දින රැස්වූ ප්‍රසම්පාදන කමිටුව විසින් අඩු මිල ගණන් ඉදිරිපත් කළ පුද්ගලික සමාගමෙන් අදාල උපකරණ ලබා ගැනීම අනුමත කර තිබුණි. ඒ පිළිබඳව සැලකිල්ලකින් තොරව නගර කඩවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අලිවැට 18 ක් ඉදිකිරීම සඳහා ග්‍රාමීය ප්‍රජාපාදක සංවිධාන වෙත රු.මිලියන 24.78 ක කොන්ත්‍රාත් පවරා තිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එම ප්‍රජාපාදක සමිති වෙත 2014 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 9.7 ක් ගෙවා තිබුණි. එම කොන්ත්‍රාත්තු ඉටු කිරීම සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට ග්‍රාමීය ප්‍රජාපාදක සංවිධාන විසින් ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කළ සමාගමෙන් මිලදී ගැනීම සිදු නොකර වැඩි වටිනාකමකින් යුත් මිල ගණන් ඉදිරිපත් කළ අනෙක් පුද්ගලික සමාගමෙන් උපකරණ මිලදී ගැනීම සඳහා සමිති වෙත ගෙවා තිබුණු මුළු මුදලම එම පුද්ගලික සමාගම වෙත නිදහස් කර තිබුණි.

(ආ) අලිවැට ඉදිකිරීම සඳහා සපයා තිබූ තාක්ෂණික උපාංග නඩත්තු වැඩ පිළිවෙලක් සකස් කර නොතිබූ අතර, භෞතික පරීක්ෂාවන්ට අනුව ඉදිකිරීම් සිදු කර මාස 06 ක් තුළ අක්‍රිය තත්ත්වයට පත්වී තිබුණි.

(ඇ) විල්ගම කැලය මැද ඉදිකිරීමට යෝජිත පරිසර උද්‍යානයක් වටා අලිවැට සකස් කිරීමට රු.මිලියන 12.9 ක වටිනාකමින් යුත් ඇස්තමේන්තු 08 ක් යටතේ 2014 දෙසැම්බර් 30 දින වන විට වැඩ ආරම්භක අත්තිකාරම් වශයෙන් එකතුව රු.මිලියන 3.6 ක් ගෙවා තිබුණි. ඒ යටතේ සපයා තිබූ උපකරණ අනාරක්ෂිතව නිෂ්කාර්යව පැවතුණි. විගණන දිනය වන විට පරිසර උද්‍යානයේ ඉදිකිරීම් නතර කිරීමේ තීරණයක් ගෙන තිබුණු අතර වර්තමානය වන විට අදාල පරිසර උද්‍යානයේ ඉදිකිරීම් නතර කර තිබුණි.

**3.12 පාඩු හා හානි**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 03 ක 2011 වර්ෂයට පෙර සිදු වී තිබූ වාහන අනතුරු 12 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(3) හා මුදල් රෙගුලාසි 104(4) යටතේ වූ පරීක්ෂණ 2015 ජූනි 30 දින වන විටත් අවසන් කර නොතිබුණි.

**3.13 අනාර්ථික ගනුදෙනු**

2013 දැයට කිරුළ සංවර්ධන වැඩසටහන යටතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කළ රු. මිලියන 2 කට වැඩි සංවර්ධන ව්‍යාපෘති 268 කින් 90 ක පමණක් වැඩ නිම කර තිබුණි. ඇතැම් ව්‍යාපෘති අවලංගු කර තිබුණි. එසේ අවලංගු කළ ව්‍යාපෘති 11 ක් වෙනුවෙන් ප්‍රසම්පාදන කමිටු සාමාජික දීමනා වශයෙන් රු.38,500 ක් හා අනෙකුත් සාමාජික දීමනා වශයෙන් රු. 27,500 ක් ගෙවා තිබුණි.

**3.14 විසඳා නොතිබුණු විගණන ඡේද**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2013 වර්ෂයේ විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව<br>ඡේද අංකය | යොමුගත විෂයය |
|---|---|
| 1.8 (iii) | ප්‍රසම්පාදන අස්ථිත්වයේ ඉහල නිලධාරියෙකු ප්‍රසම්පාදන කමිටු ලේකම් ලෙස පත්කළ යුතු වුවත් එසේ පත්කර නොතිබීම. |
| 1.8 (iii) | ප්‍රසම්පාදන කමිටු සාමාජිකයන් හා තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින් විසින් කමිටු රැස්වීම්වලදී සිදුවන කටයුතු පිළිබඳව වාණිජමය රහස්‍යභාවය පිළිබඳව තමන් ගරු කරන බව, තමන්ගේ අපක්ෂපාතීභාවය, අවංකභාවය සහ පෞද්ගලික සම්බන්ධතාවයක් නොමැති බව පිළිබඳ ප්‍රකාශන අත්සන් කර නොතිබීම. |
| 1.11 (ඇ) | ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාද කමිටුව විධිමත්ව පත්කර නොතිබිය දී ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ 2.9.2 මාර්ගෝපදේශය යටතේ වූ ආකෘතියට අනුකූලව පැමිණීමේ ලේඛන ඉදිරිපත් කර නොතිබුණි. 2013 දැයට කිරුළ ග්‍රාමීය හා ප්‍රාදේශීය වැඩසටහන යටතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති සඳහා වූ පරිපාලන වියදම් ප්‍රතිපාදන උපයෝගී කරගෙන ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින් 06 දෙනෙකු වෙත දීමනා වශයෙන් රු.807,500 ක් ගෙවා තිබීම. |
| 1.12 (අ) (II) | භෞතික විගණන පරීක්ෂාවන්හි දී අනාවරණය වූ තොරතුරු අනුව අල්ල ව්‍යාපාරය යටතේ වගා කළ බීජ සාර්ථක ලෙස පැලවී තිබිය දී පූර්ව දැනුම් දීමකින් තොරව ජලය මුදා හැරීම හේතුවෙන් ඒවා ආරක්ෂා කර ගැනීමට නොහැකිව විනාශ වී තිබුණි. මීට අදාල හානිය තක්සේරු කිරීමට හා වගකිව යුත්තන් නිශ්චය කිරීමට අදාල මූලික විමර්ශන කිසිවක් දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් සිදුකර නොතිබීම. |
| 1.12 (අ) (VII) | මුං ඇට බීජ කිලෝ ග්‍රෑම් 1 ක් රු.250 ක සිට රු.281 ක් දක්වා වූ ගණන් යටතේ මිලදී ගෙන තිබුණි. එහිදී රජයේ රු.200 ක සහනාධාර හැර ඉතිරි වටිනාකම ගොවීන්ගෙන් අය කළ යුතු වුවත්, පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාල විසින් සේරුවිල කොට්ඨාශය වෙනුවෙන් නිකුත් කළ බීජ සඳහා රු.39,528 ක් අය විය යුතුව පැවතුණි. |

| | |
|---|---|
| 1.12 (එ) (I) | කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය පිහිටි රජයේ ඉඩම් හෙක්ටයාර් 408 ක් විවිධ සංවර්ධන කාර්යයන් සඳහා බදු දීමට අදාල ගිවිසුම් 09 කට එළැඹ තිබූ අතර, දීර්ඝ කාලීන බදු ගැණුම්කරුවන් තිදෙනෙකු විසින් 2009 වර්ෂයේ සිට හිඟහිට වාර්ෂික බදු කුලිය හා ඒ මත වූ කුලියෙහි වටිනාකම රු.69,980,984 ක් වූ හිඟ බදු අයකර ගැනීම සඳහා ගිවිසුම කොන්දේසි ප්‍රකාරව ක්‍රියාමාර්ග ගෙන නොතිබීම. |
| 1.12 (එ) (II) | අදාල බදු ගැණුම්කරුවන් විසින් බදු ගිවිසුම්ගත කොන්දේසි ප්‍රකාර ඉඩම පරිහරණය කරන්නේද යන්න පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් අධීක්ෂණය කර නොතිබීම. |
| 1.12 (එ) (III) | ඉඩම් කොමසාරිස්ගේ අංක 4/10/16124 හා 1999 අගොස්තු 19 දිනැති ලිපිය අනුව නැගෙනහිර විශ්ව විද්‍යාලය සඳහා අක්කර 50 ක ඉඩමක් දීර්ඝ කාලීනව බදු දීමට අනුමත කර තිබූ අතර, අදාල බදු කොන්දේසි අනුව අයකළ යුතු වාර්ෂික බදු මුදලක් සහ වාර්ෂික බදු මුදල මෙන් තුන් ගුණයක් වූ වාර මුදල් අයකර නොතිබීම. |
| 1.12 (ඒ) | රජයේ ඉඩම්වල පදිංචිකරුවන් වෙත බෙදා දීම සඳහා 2012, 2013 සහ 2014 වර්ෂයන්ගේ ලියාපදිංචි කර තිබුණු බලපත්‍ර හා දීමනා පත්‍ර 2106 ක් කුච්චවේලි, සේරුනුවර , වෙරුගල්, නගර හා කඩවත් යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් අදාල හිමිකරුවන් වෙත නිකුත් කර නොතිබීම. |

**3.15 කළමනාකරණ දුර්වලතා**

-----------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

**(අ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

**-------------------------------------------------------------**

ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා වූ නව ගොඩනැඟිලි සංකීර්ණයක්, රු.මිලියන 399 ක ප්‍රතිපාදන යටතේ ඉදිකර 2011 ඔක්තෝබර් 12 දින විවෘත කර තිබුණි. එම ඉඩම රාජ්‍ය දැව සංස්ථාවට අයත්ව පවතින නමුත් 2015 ජූනි 30 දින දක්වා එහි නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි**.**

(ආ) පහත සඳහන් පරිදි 2014 දෙසැම්බර් 31 දිනට ලියන ලද චෙක්පත් 2015 මැයි මාසයේ විගණන දින වන විටත් ආදායකයින් වෙත නිකුත් නොකර රඳවා ගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

| **ප්‍රාදේශීය ලේකම් කාර්යාලය** | **චෙක්පත්වල වටිනාකම** |
|---|---|
| | **රු.** |
| නගර හා කඩවත් | 1,536,317 |
| කන්තලේ | 659,158 |
| ගෝමරන්කඩවල | 835,987 |
| කුච්චවේලි | 152,335 |
| | **3,183,797** |

(ඇ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ විශේෂ සංවර්ධන 2014 වැඩසටහන යටතේ ගෝමරන්කඩවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගැමුණු පුර පොදු පානීය ජල ළිං තුනක් ඉදි කිරීමමේ සංවර්ධන ව්‍යාපෘතීන්හි වැඩ නිම කර නොතිබුණි. නමුත් ඒවා සම්පූර්ණයෙන් නිම කළ බවට 2014 දෙසැම්බර් 30 දින රු. 220,868 ක වැඩ සහතික කර, ගෙවීම් නිර්දේශ කර තිබුණි.

(ඈ) කන්තලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2014 දෙසැම්බර් 31 දිනට ලියා තිබූ රු.655,239 ක වටිනාකමින් යුත් චෙක්පත් 07 කට අදාල භාණ්ඩ විගණන දිනය වූ 2014 ජනවාරි 29 දින වන විටත් සපයා නොතිබුණි.

(ඉ) කන්තලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයට අනුයුක්තව සේවය කරනු ලබන රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය II ශ්‍රේණියේ නිලධාරියකු විසින් ගෙවීම් වවුචර පිළියෙළ කිරීම , මුදල් පොත පවත්වාගෙන යාම, ප්‍රසම්පාදන මිල ගණන් කැඳවීම හා ලිපිගොනු පවත්වා ගෙන යාම, සැපයුම්කරුවන් වෙත චෙක්පත් ලබාදීම් ,ගබඩාවට භාණ්ඩ භාර ගැනීම හා ගබඩා ලේඛන පවත්වා ගෙන යාම ආදී සියළු කටයුතු ඉටු කිරිම නිසා එම කාර්යයන්ගේ අභ්‍යන්තර පාලනය දූර්වල වී තිබුණි.

## 3.16 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 හි 2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 33 | 24 | 09 | - |
| (ii) | තෘතියික මට්ටම | 33 | 15 | 18 | - |
| (iii) | ද්විතියික මට්ටම | 759 | 415 | 344 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 128 | 95 | 33 | - |
| (v) | වෙනත් (අනියම් පදනම) | - | 03 | - | 03 |
| | එකතුව | **953** | **552** | **404** | **03** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 404 ක් පිරවීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණි.